# නැගෙනහිර ශ්‍රී ලංකාවේ යුධ ගැටුම් හේතුවෙන් අවතැන් වූ ජනතාව යළි පදිංචි කිරීම ආශ්‍රිත ගැටළු:

# මඩකලපුව දිස්ත්‍රික්කයේ එරවූර්පත්තු-චෙන්කලාඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්

ජයසේකර සිරිවර්ධන දිසානායක මුදියන්සේලාගේ සරත් දයානන්ද

ශාස්ත්‍රපති 2016

# නැගෙනහිර ශ්‍රී ලංකාවේ යුධ ගැටුම් හේතුවෙන් අවතැන් වූ ජනතාව යළි පදිංචි කිරීම ආශ්‍රිත ගැටළු:

## මඩකලපුව දිස්ත්‍රික්කයේ එරවුර්පත්තු-චෙන්කලාඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්

ජයසේකර සිරිවර්ධන දිසානායක මුදියන්සේලාගේ සරත් දයානන්ද

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සපර්යේෂණ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය (භූගෝල විද්‍යාව) සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධය

## අයදුම්කරුගේ ප්‍රකාශය

මෙම නිබන්ධයේ අන්තර්ගතය ආචාර්ය පින්නවල සංඝසුමන හිමියන්ගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත් මේ පර්යේෂණ වාර්තාව කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්ව විද්‍යාලයකට ආයතනයකට වෙනත් උපාධියක්/ඩිප්ලෝමාවක් සඳහා ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

.....................                                        ............................................

**දිනය**                                        **ජේ.එස්.ඩී.එම්. සරත් දයානන්ද**

# සුපරික්ෂකගේ සහතිකය

ජේ.එස්.ඩී.එම්. සරත් දයානන්ද නම් පශ්චාද් උපාධි අපේක්ෂකයා විසින් ඉහත කරන ලද ප්‍රකාශය සත්‍ය බව මෙයින් සහතික කරමි. තව ද මෙම ස්වාධීන නිබන්ධය ඇගයීම් කාර්යය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි පීඨයට ඉදිරිපත් කිරීමට සුදුසු බවටත් නිර්දේශ කරමි.

..........................

දිනය

හිමි

.....................................

ආචාර්ය පින්නවල සංඝසුමන

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

භූගෝල විද්‍යා අධ්‍යයනාංශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

නුගේගොඩ.

# පටුන

පිටු අංකය


I. පටුන i-ii

II. සිතියම්, වගු, ප්‍රස්තාර හා රූප සටහන් නාමාවලිය iii-vi

III. පෙරවදන vii

IV. නිබන්ධ සාරාංශය viii-ix

**1. පළමුවන පරිච්ඡේදය - හැඳින්වීම**

1.1 අධ්‍යයනයේ පසුබිම 1-6
1.2 පර්යේෂණ ගැටළුව 7-8
1.3 අධ්‍යයනයේ වැදගත්කම 8-9
1.4 අධ්‍යයනයේ අරමුණු 10

**2. දෙවන පරිච්ඡේදය - සාහිත්‍ය විමර්ශනය : අවතැන්වීම සහ ප්‍රතිස්ථාපනය**

2.1 න්‍යායාත්මක පසුබිම 11-13
2.2 අභ්‍යන්තරික වශයෙන් අවතැන්වීමේ ගැටළුව පිළිබඳ විවිධ මානයන් 14-16
2.3 අභ්‍යන්තරික වශයෙන් අවතැන් වීම පිළිබඳ ශ්‍රී ලංකාවේ අත්දැකීම් 17-22
2.4 අවතැන්භාවය අවසන් කිරීම 23-28
2.5 අවතැන්වූවන් යළි පදිංචි කිරීමේ ක්‍රමෝපාය 29-32

**3. තෙවන පරිච්ඡේදය - අධ්‍යයනයේ ක්‍රමවේදය**

3.1 අධ්‍යයන ප්‍රදේශය 33-39
3.2 නියැදි ප්‍රදේශය 40-43
3.3 දත්ත රැස්කිරීම 44-46
3.4 දත්ත විශ්ලේෂණය 47-50

## 4. සිවුවන පරිච්ඡේදය - දත්ත විශ්ලේෂණය හා ප්‍රතිඵල විග්‍රහය


4.1 යළි පදිංචි කිරීම ආශ්‍රිත විශේෂිත ලක්ෂණ

4.1.1 අවතැන් වීම හා යළි පදිංචි කිරීමේ ක්‍රියාවලිය 51-55

4.1.2 යළි පදිංචි කිරීම සඳහා ආයතනික මැදිහත්වීම 56-57

4.1.3 යළි පදිංචිකරවූවන්ගේ ප්‍රධාන අවශ්‍යතා 58-67

4.1.4 යළි පදිංචි කිරිමේදී හිමිවූ ප්‍රතිලාභ 68-78

4.2 යළි පදිංචි කිරීමේ ක්‍රියාවලියේ සමාජ-ආර්ථික බලපෑම

4.2.1 අධ්‍යයන ප්‍රදේශයේ අවතැන් වීම හා යළි පදිංචිය 79-82

4.2.2 කුටුම්භ මට්ටමින් සිදු වී ඇති සමාජ ආර්ථික බලපෑම 83-105

4.2.3 ප්‍රජා මට්ටමින් යළි පදිංචි කිරීම ආශ්‍රිත ගැටළු 106-114

4.3. යළි පදිංචිකිරීමේ ක්‍රියාවලියේ ඵලදායීතාව 115-147

4.4 යළි පදිංචි කිරීම ආශ්‍රිත ගැටළු 148-153

4..5 අධ්‍යයනයේ සීමා හා ගැටළු 153-154


## 5. පස්වන පරිච්ඡේදය - නිගමන සහ යෝජනා


5.1 නිගමන 155-162

5.2 යෝජනා 163-169

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය** 170-173


**ඇමුණුම්**

## සිතියම්, වගු, ප්‍රස්තාර සහ රූප සටහන්

### සිතියම්

3.1 සිතියම - අධ්‍යයන ප්‍රදේශයේ පිටීම 35

3.2 සිතියම - අධ්‍යයන ප්‍රදේශ භූගෝලීය පිහිටීම 40

4.1 සිතියම - අවතැන්වීම හා යළි පදිංචි වීම - මංගලගම 80

4.2 සිතියම - අවතැන්වීම හා යළි පදිංචි වීම - පුද්දූර් හා පිල්ලුමලේ 81

### ප්‍රස්තාර

4.1 ප්‍රස්තාරය - අධ්‍යයන ප්‍රදේශයේ අවතැන්වීම හා යළි පදිංචිය - 52

4.2 ප්‍රස්තාරය - අධ්‍යයන ප්‍රදේශයේ නිවාස අවශ්‍යතාව 59

4.3 ප්‍රස්තාරය - ලබාදුන් ආධාර පිළිබඳ පවතින පිළිගැනීම 78

4.4 ප්‍රස්තාරය - යළි පදිංචි කරවූවන්ගේ ඉඩම් අයිතිය 97

4.5 ප්‍රස්තාරය - පිල්ලුමලේ නිවාස ආධර ලබාගත් පවුල් ගණන 101

4.6 ප්‍රස්තාරය - මංගලගම යළි පදිංචි වූවන්ගේ ණයගැතිභාවය 112

4.7 ප්‍රස්තාරය - පිල්ලුමලේ යළි පදිංචි වූවන්ගේ ණයගැතිභාවය 113

4.8 ප්‍රස්තාරය - පුද්දූර් යළි පදිංචි වූවන්ගේ ණයගැතිභාවය 114

4.9 ප්‍රස්තාරය - අවතැන් වන විට පැවැති නිවාස වල ස්වභාවය 116

4.10 ප්‍රස්තාරය - අවතැන්වීමට පෙර හා පසු නිවාසවල ස්වභාවය -මංගලගම 117

4.11 ප්‍රස්තාරය - අවතැන් වීමට පෙර හා පසු නිවාස වල ස්වභාවය -පිල්ලුමලේ 118

4.12 ප්‍රස්තාරය - අවැතැන් වීමට පෙර හා පසු නිවාසවල ස්වභාවය -පුද්දූර් 120

4.13 ප්‍රස්තාරය - අධ්‍යයන ප්‍රදේශයේ තරුණයින් ගොවිතැනෙන් ඉවත්වීම 130

4.14 ප්‍රස්තාරය - අධ්‍යයන ප්‍රදේශයේ දරුවන්ගේ උපත් බරවල වෙනස්කම් 141

## වගු

1.1 වගුව - නැගෙනහිර පළාතේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනගහනය - 2012 04
1.2 වගුව - යුද්ධය නිසා නැගෙනහිර පළාතේ සිදුවූ අවතැන් වීම - 2009 05
1.3 වගුව - නැගෙනහිර පළාතේ නැවත පදිංචි කිරීම් (2012 මුල් මාස 03 වන විට) 06
1.4 වගුව - මඩකලපුව දිස්ත්‍රික්කයේ නැවත පදිංචි කිරීම් 07
2.1 වගුව - ශ්‍රී ලංකාවේ අවතැන්වීමේ ප්‍රවණතාව 1983-2005 19
2.2 වගුව - දිස්ත්‍රික්ක අනුව අභ්‍යන්තර අවතැන් වීම- 2006 20
3.1 වගුව - දත්ත රැස් කිරීමේ ක්‍රමශිල්ප 45
4.1 වගුව - නැවත පදිංචිය සඳහා පෙළඹ වූ හේතු 54
4.2 වගුව - යළි පදිංචි ජනතාවට නිවාස ආධාර ලැබීම 57
4.3 වගුව -යළි පදිංචි ජනතාගේ රැකියා අපේක්ෂාව 62
4.4 වගුව - පාසල්වල පවතින භෞතික හා මානව සම්පත් 2015 65
4.5 වගුව -ඉන්දියන් ආධාර කොටස් වශයෙන් ලබා දීම 71
4.6 වගුව - මල්ලක අඩංගු වියළි ආහාර හා වෙනත් ද්‍රව්‍ය හා ප්‍රමාණය 72
4.7 වගුව - ජීවිත හානි වල ස්වභාවය හා ලැබී ඇති වන්දි - මංගලගම හා පිල්ලුමලේ 77
4.8 වගුව - යළි පදිංචි වූ ජනතාවගේ ආර්ථික කටයුතු 84
4.9 වගුව - මංගලගම ජනතාවගේ ආදායම් මාර්ග හා මාසික ආදායම 88
4.10 වගුව- පිල්ලුමලේ ජනතාවගේ ආදායම් මාර්ග හා මාසික ආදායම 91
4.11 වගුව - පුද්දූර් ජනතාවගේ ආදායම් මාර්ග හා මාසික ආදායම් ප්‍රමාණය 93
4.12 වගුව - අවතැන් වීමට පෙර හා පසු වැසිකිළි පහසුකම් 108
4..13 වගුව -අවතැන් කඳවුරුවල අවතැන් වූවන් නැවත පදිංචි කල ස්ථානය මඩකලපුව 124
4.14 වගුව - වී වගාවේ ප්‍රවණතා පිල්ලුමලේ පුද්දූර් 127
4.15 වගුව - අධ්‍යයන ප්‍රදේශයේ ගොවිතැන් කටයුතු සඳහා ලබාගත් ණය 133
4.16 වගුව -අධ්‍යයන ප්‍රදේශයේ මාසික ආදායම් තත්වය 136
4.17 වගුව -අධ්‍යයන ප්‍රදේශය තුළ පාසල් සෞඛ්‍ය සායන පැවැත්වීම 2013-2015 138
4.18 වගුව -අධ්‍යයන ප්‍රදේශයේ දරුවන්ගේ සෞඛ්‍ය තත්වය සොයා බැලීම 140
4.19 වගුව - ප්‍රදේශයේ පාසල්වල භෞතික හා මානව සම්පත් වල වෙනස් වීම 143
4.20 වගුව - පිල්ලුමලේ විද්‍යාලයේ ප්‍රාථමික හා ද්විතික අංශයේ ශිෂ්‍ය සංඛ්‍යාව 144

## රූපසටහන්

3.1 රූප සටහන - පර්යේෂණ ක්‍රමවේදය 34
3.2 රූප සටහන - නියැදීම 44
3.3 රූප සටහන - දත්ත විශ්ලේෂණය හා ඉදිරිපත් කිරීම 48
3.4 රූප සටහන - විශ්ලේෂණ ක්‍රම ශිල්ප 49

# පෙරවදන

මිනිස් පරිසර සබඳතාවය තුළින් නිර්මිත මානව කටයුතු වල අවකාශීය සංවිධානය අධ්‍යයනය කිරිම මානව භූගෝල විද්‍යාවේ පදනම වේ. මානව භූ දර්ශනය තුළට මිනිස් ගහනය හා ජනාවාස මිනිසාගේ ආර්ථික කටයුතු, සමාජික සංස්කෘතික හා දේශපාලනික යනාදී සියලු කටයුතු ඇතුළත් වේ. මෙම සංසිද්ධි හා ක්‍රියාවලිය තුළ එක් සංසිද්ධියක් ලෙස යළි පදිංචි කිරීම නැතහොත් නැවත ජනාවාසකරණය පෙන්වා දිය හැකිය. විශේෂයෙන් යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙස බිහි වූ හා බිහි වන මානව භූ දර්ශනය හා එහි ආවකාශීය රටාව අධ්‍යනය කිරීම පර්යේෂණයේ අරමුණ වශයෙන් දැක්විය හැකිය. මානව අවතැන්වීම හා ඒ ආශ්‍රිත ගැටළු පිළිබඳව සමාජ භූගෝල විද්‍යාත්මක යථාදර්ශයකින් (Socio-geographical Perspective) විග්‍රහ කිරීමේ දී එම සංසිද්ධිය හා බැඳුන සංචලතාව (Movement) අවකාශිය සංවිධානය (Spatial organisation) මෙන්ම අවකාශීය ගැටළු කෙරෙහිද අවධානය යොමු විය යුතුය. කිසියම් සංසිද්ධියක් කාලය හා අවකාශයට අනුව හැසිරෙන්නේ කෙසේදයි යන්න පෙන්වීමට යුධ අනාථභාවය (War- displacement) හොඳ උදාහරණයකි. අවතැන් වීමේ ක්‍රියාවලියේ ස්වභාවය, ගති ලක්ෂණ (Characteristics) හා අවකාශීය රටා (Spatial patterns) හඳුනා ගැනීමේ දී භූගෝල විද්‍යාත්මක දැනුම ප්‍රයෝජනයට ගත හැකිය. අවතැන් වීමේ සිට යළි පදිංචි කිරීම දක්වා වූ සමස්ත ක්‍රියාවලිය තුළ ඉහත කී භෞතික හෝ මානව හේතූන් විවිධාකාරයෙන් ඒ හා බද්ධ වී තිබේ.

සමස්තයක් වශයෙන් ගත් කල යුද්ධයෙන් අවතැන් වූවන් යළි පදිංචි කිරීම සම්බන්ධයෙන් සිදුකර ඇති පර්යේෂණ සීමිතය. ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ මෙය වඩාත් කැපී පෙනේ. අවතැන් වූවන් සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනයේදී ශ්‍රී ලංකාවේ වඩාත් අවධානය යොමු වී ඇත්තේ ඔවුන් සිය මුල් ගම්බිම් වෙත ආපසු යැවීම හෝ වෙනත් ස්ථානවල යළි පදිංචි කිරීම යන ක්‍රමවේද දෙකටය. විශේෂයෙන්ම අවතැන් වූවන් නව පරිසරයකට අනුකලනය වීමේදී ආයතනික වශයෙන් සිදුකරන හා සිදුකළ හැකි කාර්යභාරය පිළිබඳව විවිධ පර්යේෂණ මගින් අවධානය යොමුකර ඇතත් අවතැන් වූවන් යළි සිය වාසභූමි මත දිගු කාලීන වශයෙන් ජීවිත ගොඩනගා ගන්නා ආකාරයත් එහිදී මුහුණ දෙනු ලබන විවිධ ගැටළුත් එතරම් අවධානයට යොමු කර නැත. යුධ ගැටුම් හේතුවෙන් සිදුවන අවතැන් වීමේ ගැටළුව සඳහා ස්ථිරසාර විසඳුම් සෙවීමේදී ප්‍රධාන වශයෙන් අනුගමනය කෙරෙන යළි පදිංචි කිරීමේ ක්‍රියාවලිය හා බැඳුණු සමස්ත ක්‍රියාවලිය ම ඉතා වැදගත් වෙයි. තම සුපුරුදු වාසස්ථානය අතහැර ගොස් යළිත් එම ගම්බිම් සොයා පැමිණියවුන් එම පරිසරයට අනුගතවීමේ දී ක්‍රියා කරන ආකාරය කාලීන හා අවකාශිය වශයෙන් විවිධත්වයක් දරයි. පශ්චාත් යුධ ගැටුම් අවධියක සිටින ශ්‍රී ලංකාව හමුවේ ඇති එක් ප්‍රධාන අභියෝගයක් වන්නේ දීර්ඝ කාලයක් තිස්සේ යුධ ගැටුම් හේතුවෙන් අවතැන්වී තාවකාලික කඳවුරු වල හා වෙනත් විවිධ ප්‍රදේශවල වාසය කළ අවතැන්වූවන් සඳහා ස්ථිරසාර විසඳුම් සෙවීමයි. ශ්‍රී ලංකාවේ ගැටුම් හේතුවෙන් අවතැන් වී සිටින විවිධ ජනකොටස් අතුරෙන් වසර විස්සකට අධික කාලයක් පුරා තාවකාලික පදිංචිය

ලබාගෙන නව පරිසරයන්හි වාසය කර යළි සිය ගම්බිම්වලට පැමිණියවුන් බොහෝය. දීර්ඝ කාලයක් තිස්සේ ඔවුන් ආශ්‍රිතව සිදුවෙමින් පවත්නා වෙනස්වීමේ ක්‍රියාවලිය තුළ අවතැන් වූවන් විසින් අනුගමනය කරනු ලැබූ සුවිශේෂ ක්‍රමෝපායන් දැකිය හැකිය. ඒවා නිසි පරිදි අධ්‍යයනයකට ලක් කිරීමෙන් යළි පදිංචි කිරීම පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනයේදී ඉවහල් කර ගත හැකිය.

අධ්‍යයනය මගින් හෙළිවන තොරතුරු අනුව යළි පදිංචි කිරීම සම්බන්ධ විවිධ අභියෝග ඇති බව පෙනේ. මෙවැනිම අභියෝග රාශියකට පර්යේෂණය ආරම්භයේ සිට අවසාන වන තෙක්ම මුහුණ දීමට සිදුවීම, අත්දැකීම් බොහොමයක් ඇහිඳ ගැනීමට මගපෑදුවාය. අධ්‍යයන ප්‍රදේශයට යන මග අනතුරු දායක වීම එයින් පළමු වැන්නයි. අධ්‍යයන ප්‍රදේශයට දෙමළ හා මුස්ලිම් ගම් අයත් වූ හෙයින් ද්‍රවිඩ භාෂාව දැන නොසටීම තවත් අභියෝගයක් විය. මෙනිසා භාෂා පරිවර්තනයට සහය වූ පිල්ලුමලේ විශ්‍රාමික පී. සෙල්වරාජා මහතාටත්, ගැමියකු වූ මුත්‍යා මනිරාසා මහතාටත්, පුද්දූර් වල ඒ. එම්. මුස්තාපා මහතාටත් ස්තූති වන්ත විය යුතුය. විවිධ ආකාරයෙන් සහය දැක් වූ ලංකාදීප වාර්තා කරුවකු වන මංගලගම ඒ. අධිකාරි මහතාද සිහිපත් කල යුතුය. එමෙන්ම තොරතුරු ලබාදුන් ගම් තුනහි යළි පදිංචි වූ ජනතාවටද, ග්‍රාම නිලධාරී මහත්ම මහත්මීන්ටද, එරාවූර් පත්තු-චෙන්කලාඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කාර්යාලයේ කාර්ය මණ්ඩලයටද වෙසසින් ස්තූති වන්ත විය යුතුය. තොරතුරු ලබා ගැනීමේ දී සහය වූ මාගේ ශිෂ්‍ය එච්. මිලාන් ඉඳුනිල් හා කේ. සජීව දිල්ශාන් කැප කළ මහන්සිය අගය කල යුත්තකි.

එමෙන්ම මාගේ සපර්යේෂණ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා මාතෘකාව තෝරා ගැනීම, පර්යේෂණ යෝජනාව සකසා ගනීම, සාහිත්‍ය විමර්ශනය හා පර්යේෂණ නිබන්ධනය සඳහා මා පිටුපස සිට මාර්ගෝපදේශ දෙමින් මා දිරි ගැන්වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ, භූගෝල විද්‍යා අධ්‍යනාංශයේ හිටපු අධ්‍යනාංශ ප්‍රධාන ආචාර්ය පින්නවල සංඝසුමන හිමියන්ට ද අධ්‍යයනාංශ ප්‍රධාන තුමිය ඇතුළු ආචාර්යමණ්ඩලයට ද කෘතඥතාව පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

# නිබන්ධ සාරාංශය

කිසියම් භෞතික හෝ භෞතික නොවන හේතුවක් හෝ හේතු කිහිපයක් බලපෑමෙන් තම ගම්බිම් අතහැර දමා ගොස් තාවකාලිකව තම රට තුළම වාසය කරන්නන් ආභ්‍යන්තරික වශයෙන් අවතැන් වූවන් (Internally Displaced Persons (IDPs) වශයෙන් හඳුන්වයි. අවතැන් වීම කෙරෙහි ගංවතුර, නායයාම් සහ සුළිකුණාටු ආදී ස්වාභාවික ආපදා මෙන්ම මිනිස් මැදිහත්වීමෙන් නිර්මිත ව්‍යවසනයන් ද බලපා තිබේ. ඊට අමතරව සංවර්ධන ව්‍යාපෘති මගින් සිදුවන අවතැන් වීම්ද බහුල වශයෙන් ලොව පුරා වාර්තා වෙයි. අවතැන් වීමට බලපාන හේතුවේ ස්වරූපය කුමන පරිමාණයකට අයත් වුවද එමගින් සිදුවන සමාජ බලපෑම දශක ගණනාවක් පුරා පවතින බව ශ්‍රී ලංකාව ඇතුළු යුධ ගැටුම් පැවැති බොහෝ රටවල් උදාහරණ කොට පෙන්විය හැකිය. ආභ්‍යන්තරික වශයෙන් අවතැන් වීමේ ගැටළුවට ස්ථිරසාර විසඳුම් සෙවීමේ දී මේතාක් විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාමාර්ග අනුගමනය කර ඇතත් යළි පදිංචි කිරීම (Resettlement) සහ නව පරිසරට අනුකලනය කිරීම (Integration) ආශ්‍රිත අභියෝග විවිධ ස්වරූපයෙන් තවමත් දක්නට ලැබේ. මේ පසුබිම මත පිහිටා ශ්‍රී ලංකාවේ පශ්චාද් යුධ සමය තුළ යළි පදිංචිවූ ජනතාව මුහුණ පා ඇති ගැටළු සමාජ භූගෝල විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් විශ්ලේෂණය කිරීමේ අරමුණින් මෙම අධ්‍යයනය සිදු කරන ලදි. නැගෙනහිර ශ්‍රී ලංකාවේ යළි පදිංචි කිරීමේ ක්‍රියාවලිය සාර්ථක වීම හෝ අසාර්ථකවීම කෙරෙහි බලපා ඇති සාධක මොනවාද? ඒවා අවකාශීය වශයෙන් හෝ ජාතිකත්වය අනුව වෙනස් වන්නේ ද? යන කේන්ද්‍රීය ප්‍රශ්න මුල් කර ගනිමින් අධ්‍යයනයේ සංකල්පීය රාමුව ගොඩනගන ලදි. ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කය අධ්‍යයන ප්‍රදේශය වශයෙන් තෝරාගෙන ජාතිකත්වය පදනම් කරගනිමින් ස්ථරීභූත නියැදි ක්‍රමයට අනුව තෝරාගනු ලැබූ ග්‍රාම නිලධාරි වසම් තුනක් ප්‍රාථමික දත්ත රැස්කිරීම සඳහා නියැදි ලෙස මෙහිදී තෝරාගෙන ඇත. ගුණාත්මක දත්ත රැස්කිරීමේ ක්‍රම ශිල්පවලට ප්‍රමුඛත්වය දෙමින් ප්‍රමාණාත්මක ශිල්පීය ක්‍රම ද භාවිතා කරනු ලැබූ මෙම අධ්‍යයනයේ ප්‍රධාන විශ්ලේෂණ ක්‍රමවේදය වූයේ විස්තරාත්මක විග්‍රහයන් සහිත ආඛ්‍යාන විශ්ලේෂණයයි. එම ගුණාත්මක විශ්ලේෂණය පහසු කරවීම පිණිස සරල සංඛ්‍යාන ක්‍රමශිල්ප ද භාවිතයට ගන්නා ලදි. දත්ත විශ්ලේෂණයේ ප්‍රතිඵල අනුව ජාතිකත්වය අනුව යළිපදිංචි කිරීමේ ගැටළුවල විවිධත්වයක් නොපෙන්වන අතර එම ගැටළු ඉස්මතු වීම කෙරෙහි අවකාශීය දුර, පිහිටීම, සම්පත් විභවතාව ආදී භූගෝලීය සාධක ද බලපා තිබේ.

යළි පදිංචි කිරීමේ ක්‍රියාවලියේ මුල් භාගය තුළ රාජ්‍ය නොවන සංවිධානවල භූමිකාව ඉතා ඉහළ මට්ටමකින් පැවැතිය ද පසුකාලීනව ඒවායේ සක්‍රීය දායකත්වය අඩු වී රාජ්‍ය ආයතන හරහා දේශපාලන මැදිහත්වීම් ඉස්මතු වීම කැපී පෙනෙන ලක්ෂණයකි. යුද්ධයෙන් අවතැන්වූවන් යළි පදංචිවීමේ ක්‍රියාවලියට ඵලදායී ලෙස අන්තර්ග්‍රහණය වීම හෝ නොවීම කෙරෙහි විවිධ හේතු බලපා තිබේ. ඒ අතුරෙන් අවතැන් වී පිටත ගතකල ප්‍රදේශය හා කාලය, මුල්ගම සමග පවත්වා ගනු ලැබූ අඛණ්ඩ සබඳතාව මෙන්ම ස්ථානීය රුචිකත්වය ආදී සාධක

ප්‍රධාන වෙයි. යළි පදිංචියට ගම්බිම් බලා ගිය ප්‍රජාවගේ ප්‍රත්‍යානුකලනය ඉලක්ක කරගත් වැඩසටහනක් ක්‍රියාත්මක වීම ඉතාම දුර්වල මට්ටමක පවතී. ඒ හේතුවෙන් වාර්ගික සංහිඳියාවට ඇති අභියෝග වැඩිවෙමින් පවතී. එය යළි පදිංචි කිරීමේ ක්‍රමෝපායන් ආසාර්ථක වීම කෙරෙහිද බලපා තිබේ. දේශපාලනික න්‍යායපත්‍රානුකූල සංවර්ධන ප්‍රවේශ හේතුවෙන් යළිපදිංචි කරවූවන් අතර ඇතිවිය හැකි පරතරය තවදුරටත් පුළුල්වීමට ඇති අවකාශ ගොඩනැගෙමින් පවතී. අවතැන්වීමට පෙර පැවැති සාම්ප්‍රදායික ආර්ථික ක්‍රම සම්පූර්ණයෙන්ම පසෙකලා නව ජීවනෝපායන් දිරිගැන්වීමට යාමෙන් පරම්පරා ගැටුම් උත්සන්න වෙමින් පවතී. මෙය ප්‍රබල වශයෙන් දක්නට ලැබෙන්නේ ද්‍රවිඩ සහ මුස්ලිම් ජනතාව ඇසුරෙනි. ප්‍රදේශයේ යළි පදිංචි කළ ජනතාව සමස්තයක් වශයෙන් මුහුණ පා සිටින පොදු ගැටළුව වන්නේ ඉඩම් සම්බන්ධ අර්බුදයයි. ඒවාට අමතරව යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම, ණයගැතිභාවය, නිසි වයසට පෙර පාසල් හැරයාම, වන්දි ලබා ගැනීම හා සම්බන්ධ ගැටළු, යැපුම් මානසිකත්වයට හුරු වී සිටීම වනි ගැටළු රාශියක් පශ්චාද් යුධ සමයේ මඩවලපුවේ යළි පදිංචි කළ ජනතාව අත්දකිමින් සිටිති. මෙබඳු පසුබිමක් යටතේ අනුගමනය කිරීමට සුදුසු නිශ්චිත ක්‍රමෝපායන් රැසක් අධ්‍යයනයෙන් එළඹුණු නිගමන පදනම් කර ගනිමින් යෝජනා වශයෙන් ඉදිරිපත් කර ඇත.

ප්‍රමුඛ පද - අභ්‍යන්තරික අවතැන්වීම, යළි පදිංචි වීම, ප්‍රත්‍යානුකලනය, ගැටළු හා අභියෝග